

# මම ආදරවන්තයෙක්
## - පුබුදු චතුරංග

**මෑත කාලයේ ඔබ පිළිබඳ බොහෝදෙනා කතාබහ කරන්නේ 'ප්‍රවේගය' චිත්‍රපටය තිරගත වීමත් සමඟයි.**

'ප්‍රවේගය' කියන්නේ මගේ දාහතර වැනි චිත්‍රපටයයි. 'ප්‍රවේගයි චිත්‍රපටයේ තිබෙන විශේෂත්වය වන්නේ විශාල පිරිවැයක්, විශාල තාත්ෂණික සහයෝගයක් සහ විශාල නළු - නිළියන්, කාර්මික ශිල්පීන් රැසකුත් සමඟම රූ ගත කිරීම් කළ චිත්‍රපටයක් වීමයි. එහි පිටපතටත් මගේ දායකත්වයක් තිබුණා. එය මගේ දෙවැනි තිරරචනයයි. මා ලියූ තුන්වැනි තිරරචනය වන 'මායා' තව නොබෝ දිනකින් තිරගත වේවි.



**'මායා' කියන්නේ ඔබ ලියූ ස්වතන්ත්‍ර තිර රචනයක් ද?**

මේ වනවිට ස්වතන්ත්‍ර තිරරචනයක් ලියලා තිබෙන බව සැබෑයි. එහෙම වුණත් ඒවා තවම එළියට දැම්මේ නැහැ. මොකද ස්වතන්ත්‍ර නිර්මාණ කරන්න තවම සිනමාව කර්මාන්තයක් විදියට සුදුසු ද නැද්ද කියන ප්‍රශ්නය තිබෙනවා. මේ අර්බුදය නිසයි ස්වතන්ත්‍ර නිර්මාණයකින් තවම එළියට එන්න බැරිවුණේ.

**වර්තමාන ලංකාවේ සිනමා ක්ෂේත්‍රය පිළිබඳ ඔබට තිබෙන්නේ මොන වගේ අදහසක් ද?**

මේ වනවිට මම සිනමාවට ඇවිත් වසර දහයක්. ඒ වසර දහය තුළ මා සිනමාවේ සිදුවුණු අනුකලනයන්, අවකලනයන් දෙස බලාගෙන සිටියා. මට තිබෙන ප්‍රශ්නය නම් ඇයි කිසිම ඉහළ බලධාරියකුට සිනමාව ගොඩදැම්මේ අවශ්‍යතාවක් නැත්තේ කියලා. සරලව කියනවා නම් එක ඇමති කෙනෙකුගේ වියදමින් ලංකාවේ සිනමාව ගොඩ දාන්න පුළුවන්. මේ වනවිට අපේ රටේ සිනමාවේ කඩා වැටීමක් නොවෙයි තිබෙන්නේ. මේ ඇති වී තිබෙන්නේ කර්මාන්තයේ අර්බුදයක්. එතැනත් අපේ රටේ චිත්‍රපටවල කර්මාන්තයේ අර්බුදයකුයි තිබෙන්නේ.



**බොහෝ වෙලාවට පුංචි තිරයේ අතිශය ජනප්‍රිය වුණු නළු - නිළියන් සිනමාවේදී ෆෙල් වෙනවා. මේ තත්ත්වය ඔබටත් පොදු ද?**

නැහැ. මම ආවේ සිනමාවෙන්. මම ටෙලි විෂන් එකට එන්නේ වරින්වරයි. අවසන් වරට මම ටෙලි විෂන් එකේ පෙනී සිටියේ මීට වසර හතරකට පෙරයි. ඒ පැමිණිය වෙලාවෙත් මම ලංකාවේ රෙකෝඩ් එකක් තිබ්බා. ඒ වැඩිම ප්‍රේක්ෂකයන් පිරිසක් නැරැඹුව ටෙලි නාට්‍යය 'රන්සමනලයෝ' විදියටයි. මම මෙවර රඟපාන්නේ 'කාසිවත්ත' ටෙලි නාට්‍යයෙයි. මෙවර මට ටෙලි විෂන් එකේ වැඩිපුර කාලයක් ඉන්න ඕනෑ කියලා සිතුණා. ඒ වසර හතරකට පස්සේ ආව නිසා. මම ටෙලි විෂන් එකට එන්නේ නැතිව ඉන්න අවස්ථාවල ප්‍රේක්ෂකයන් විමසන්නේ ඇයි ඔබ ටෙලි නාට්‍යවලට එන්නේ නැත්තේ කියලා. ඒ සඳහා ප්‍රේක්ෂකයන්ගෙන් ලොකු ඉල්ලුමකුත් තිබුණා. ඒ නිසා ඔවුන්ගේ අදහස්වලට ගරු කරලා යම් යම් අවස්ථාවල ටෙලි විෂන් එකට ඇවිත් පෙනිලා යන්න අපට සිද්ධ වෙනවා. මේ නිසයි මම යළිත් ටෙලි විෂන් එකට පැමිණියේ.

**ඔබගෙන් ප්‍රවීණ නළු ගාමිණී ෆොන්සේකාව අනුකරණය කරන්නේ ඇයි කියලා විමසුවොත් කුමක් ද පවසන්න තිබෙන්නේ?**

මම ගාමිණී ෆොන්සේකා අනුකරණය කළා නම් 'චැලෙන්ජර්ස්' චිත්‍රපටය ඇතුළු අනෙකු නිර්මාණවල රඟපාන්න බැරි වෙනවා. මම එහෙම අනුකරණය කරන්නේ නැහැ. ඒක බොරු කතාවක්.

**ඔබ ආදරවන්තයෙක් ද?**

ඔව්.

**අපට ඇය ගැන කියන්න අකැමැති ද?**

මේ දවස්වල ඇය ජනප්‍රිය රංගන ශිල්පිනියක්. එහෙම කියලා මම නවත්වන්නම්. නම කියනවාට වඩා හොඳයි නම නොකියා ඉන්න එක.

මාෂා විස්වාශිනී